**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2010**

**-------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන.

-----------------

1.1 මතය.

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත.

--------------------------------

2010 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.30,014,191 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 06 කට අදාළ ක්ෂය අඩු කළ පසු වටිනාකම ශුන්‍ය වී තිබුණ නමුත්, එම ස්ථාවර වත්කම් නොකඩවා ප්‍රයෝජනයට ගනු ලබන හෙයින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 අනුව, ප්‍රත්‍යාගණනය කර, එම වටිනාකම් ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු.

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ 2011 වර්ෂයේ දී වැය කළ , රු.612,277 ක් වූ වියදම් වර්ග 06 ක් උපචිත පදනම යටතේ ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන්, එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් සහ වියදම් ණයහිමියන් අඩුවෙන් පෙන්නුම් කෙරේ.

(ආ) පූර්ව වර්ෂය වෙනුවෙන් 2011 වර්ෂයේ දී වැය කළ, රු.42,050 ක් වූ වියදම් දෙකක් වෙනුවෙන් අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිපාදන සැළසීමට කටයුතු නොකිරීම හේතුවෙන්, එම ප්‍රමාණයෙන් උපචිත වියදම් ගිණුම සහ ප්‍රාග්ධන අරමුදල් ගිණුමේ වටිනාකම පිළිවෙළින් අඩුවෙන් සහ වැඩියෙන් පෙන්නුම් කෙරේ.

1.2.3 නොසැසඳීම්.

-------------

ගිණුම් විෂයයන් 12 ට අදාළව මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන එකතුව රු.26,926,186ක් වූ අතර, ඊට අදාළ පාලන ගිණුම් අනුව එකතුව රු.26,887,458 ක් විය.

1.2.4 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

(i) වර්ෂ 02 සිට 07 දක්වා කාලයකට අදාළ රු.245,081 ක හිඟහිටි සේවක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2001 සිට 2007 වර්ෂය දක්වා රු. 640,117 ක් වූ විගණන ගාස්තු වලින් රු.9,685 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හිඟහිටිව තිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | පුස්තකාල පොත් | 9,724,162 | (i) පරිග්‍රහණ ලේඛනය<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ආ) | ස්ථාවර වත්කම් (පිරිවැය) | 122,614,025 | (i) ස්ථාවර වත්කම් ලේඛනය<br>(ii) උපලේඛන |
| (ඇ) | පර්යේෂණ ප්‍රදාන | 12,731,536 | ප්‍රගති වාර්තා. |
| (ඈ) | විදේශ ගමන් - පර්යේෂණ | 711,901 | ගමන් සඳහා අවශ්‍ය නිර්දේශය සහ අනුමැතීන් සනාථ කරන ලියවිලි. |
| (ඉ) | ස්ථාවර වත්කම් අපහරණය කිරීම (විද්‍යාගාර හා ඉගෙනුම් උපකරණ) | 1,444,856 | අපහරණය කරන ලද, ස්ථාවර වත්කම් වලින් අයිතම 54 කට අදාළ පිරිවැය වටිනාකම්. |

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | පනත් | |
| | (i) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය | මාස 03 කට පෙර අයවැය ලේඛනය පිළියෙල කර පාලක සභාවෙන් අනුමත කරගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සඳහා එසේ කටයුතු කර නොතිබුණි. |
| | (ii) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | ආයතනය සතු අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේ දී අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය සමඟ මුදල් ඇමතිවරයාගේ එකඟතාවය ලබා ගතයුතු වුව ද, වර්ෂය අවසාන ගිණුම්වල දක්වා ඇති එකතුව රු.118,307,817 ක් වූ ස්ථාවර තැන්පත් ආයෝජනය කිරීම සම්බන්ධව එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | රජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 371(2)(ඇ) | (i) තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික ගණයේ නිලධාරීන්ට පමණක් ලබා දිය හැකි වුවද, මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 11 ක දී රු.60,500 ක අත්තිකාරම් ලබා දී තිබුණි.<br><br>(ii) ආයතනය ලබා දෙන ලද අත්තිකාරම් අදාළ කාර්ය නිම කළ විගසම පියවියයුතු වුවත්, අවස්ථා 16 ක දී රු.515,692 ක මුදලක් මාස 02 සිට මාස 10 ක කාල ප්‍රමාදයකින් පියවා තිබුණි. |

| | | |
|---|---|---|
| | | (iii) අවස්ථා 03 ක දී, ලබා දුන් රු.66,000 ක අත්තිකාරම් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන දින 21 සිට මාස 07 ක කාල පරාසයක් අත රඳවා ගෙන පියවීම් කර තිබුණි. |
| | (ii) මු.රෙ.135,136 හා 137 | ආයතනයේ සේවය කරනු ලබන නිලධාරීන් හට සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බලතල පවරා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 2.2 උප වගන්තිය. | රජයේ සේවයෙන් ලබා ගත් පුහුණුව භාවිතා කරමින් කාර්යාල වේලාවෙන් පරිබාහිරව කරනු ලබන කාර්යලයීය නොවන වැඩ වෙනුවෙන් ලැබෙන ගාස්තුවෙන් 10% ක් ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ දී දේශනවල නිරත වූ නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.48,160 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති ලිපිය. | පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2010.09.18 දිනැති අංක 88-10-01 දරන පාලක මණ්ඩල තීරණය | කෙටිකාලීන වැඩමුළු සඳහා සම්පත්දායක දීමනා ගෙවීමේ දී ආයතනයේ බාහිර කථිකාචාර්යවරයකුට GIS පාඨමාලා සඳහා දේශන පැයකට රු.1,250 ක් ද, ප්‍රායෝගික පුහුණුව සඳහා දේශකවරයකුට රු.750 ක් හා ප්‍රදර්ශකවරයකුට රු.400 ක් ද, බැගින් ගෙවිය යුතු වුවත්, එම ප්‍රමාණය ඉක්මවා එකතුව රු.26,250 ක දේශන ගාස්තු හා රු.145,475 ක ප්‍රායෝගික පුහුණු ගාස්තු ගෙවා තිබුණි. |

1.2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු.

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1978 මාර්තු 10 හා අංක පීඊ/1/174/11(ආ) දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂක ජනරාල්ගේ චක්‍රලේඛ ලිපියට පටහැනිව, දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනා වෙනුවෙන් හිමිකම් නොමැති නිලධාරින්හට 1997 සිට 2010 වර්ෂය දක්වා රු.212,230 ක දීමනා ගෙවා තිබුණි.

(ආ) 2003 ජුලි 18 දිනැති අංක පීඩී/අයිඑන්එස්/සීඑල්යූඑස්-ඒ/078 දරන අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ලිපියට පටහැනිව සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් දායකය ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාද ඇතුළුව ගණනය කිරීම හේතුවෙන් 1998 සිට 2010 වර්ෂය දක්වා පිළිවෙලින් රු.419,550 ක් හා රු.83,910 ක දායක මුදල් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8.2 වගන්තියේ දැක්වෙන සැතපුම් කුලී ප්‍රමාණයන් ඉක්මවා කළමනාකරණ මණ්ඩල තීරණ අංක 74 මගින් කිලෝ මීටරයකට රු.25 ක් බැගින් ගෙවීමට අනුමත කර තිබීම හේතුවෙන් දේශකවරුන්ට අවස්ථා 16 කදී රු.80,062 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) පැය 84ක අනුමත අතිකාල පැය ප්‍රමාණය ඉක්මවා සේවයේ යෙදුනු නිලධාරීන් පස් දෙනෙකුට අවස්ථා 18 කදී රු. 59,974 ක අතිකාල දීමනා ගෙවා තිබුණි.

(ඉ) පර්යේෂණ ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන නොවීම නිසා, ආයතනයේ අරමුදලින් වැය කරන ලද රු.21,052 ක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.2.8 මතභේදයට තුඩු දෙන ගනුදෙනු.

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා කෘෂිකර්ම ප්‍රතිපත්ති සභාවේ විධායක අධ්‍යක්ෂ හා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ අතර සෝයා බෝංචි වගාව සඳහා පොහොර වෙනුවට "රනිලසාර ආමකුලක" නම් ආදේශකය භාවිතා කිරීම සඳහා 2005 ජනවාරි 12 සිට වර්ෂ 03 කදී පර්යේෂණයක් කිරීමට ලබා දී තිබූ රු.4,646,980 ක ප්‍රදානය සහ එහි ප්‍රතිඵලය මත යූරියා පොහොර වෙනුවට භාවිතා කළ හැකි එම ආදේශකය ආයතනය විසින් 2008 වර්ෂයේ සිට නිෂ්පාදනය කර බෙදාහරින අතර, එවැනි නිෂ්පාදනයක් කිරීම හෝ ව්‍යාපාරික කටයුත්තක් කිරීමට ආයතනය පිහිටුවීමේ පනත මගින් නීත්‍යානුකූල ප්‍රතිපාදන සළසා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේ දි ආරම්භ කරන ලද රයිසෝබියම් ව්‍යාපෘතිය, ආරම්භක වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා විධිමත් අධීක්ෂණයක් හෝ පර්පාලනයක් නොමැතිකම මත එම කාලච්ජේදයට අදාල ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබුණි. 2008 සිට 2010 වර්ෂය දක්වා උපයන ලද ආදායම රු.3,883,350 ක් සහ වියදම රු.4,054,035 ක් පර්යේෂණ ප්‍රදාන යටතේ දක්වා තිබුණද මෙම ව්‍යාපෘතිය වාණිජමය ස්වරූපයේ කටයුත්තක් බැවින්, මෙම කාර්යයට අදාල මූල්‍ය ප්‍රකාශන වෙනම සකස් කර නොතිබුණි.

(ඇ) විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2010 ජනවාරි 19 දින සිට බල පැවැත්වෙන වැඩමුළු, සම්මන්ත්‍රණ, කෙටිකාලීන පාඨමාලා සඳහා වන අනුපාත ගෙවීම් පත්‍රිකාව අනුව, කිලෝ මීටරයට රු.6.25 බැගින් ගමන් වියදම් ලෙස ගෞරවාන්විත දීමනාවක් ගෙවීම පිණිස අනුමැතිය ලබාදී තිබුණද එයට පටහැනිව කෙටිකාලීන පාඨමාලා 07 ක් සඳහා දේශකවරුන් දෙදෙනෙකුට අවස්ථා 14 කදී ප්‍රවාහන වියදම් ලෙස අයවැයගත අගයන් අනුව එකතුව රු. 64,500 ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය සමාලෝචනය.

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ආයතනයේ වැඩකටයුතු වලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.5,639,112 ක අතිරික්තයක් පැවතුණි. රු.14,000,000 ක්වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු මෙම අතිරික්තය රු.19,639,112 ක් දක්වා වැඩි වී තිබුණි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.9,647,381 ක අතිරික්තයක් පැවතුණු අතර, රු.9,800,000 ක් වු පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු මෙම අතිරික්තය රු.19,447,381 ක් දක්වා වැඩි වී තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය.

### 2.2.1 කාර්ය සාධනය.

2004 වර්ෂයේ සිට 2010 දක්වා එක් එක් වර්ෂයේ ලියාපදිංචි වු සිසුන්ගෙන් 2011 මැයි 24 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කිරීමට නොහැකි වු සිසුන් ප්‍රමාණය ලියාපදිංචි වු සිසුන් සංඛ්‍යාවෙන් 10% ක් 76% ත් අතර විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලියාපදිංචි වු සිසුන් සංඛ්‍යාව | 2011 මැයි 24 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ නොකළ සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|
| 2004 | 277 | 27 | 10 |
| 2005 | 159 | 27 | 17 |
| 2006 | 385 | 149 | 39 |
| 2007 | 351 | 202 | 57 |
| 2008 | 330 | 251 | 76 |
| 2009 | 187 | *නිබන්ධන සම්පූර්ණ කර නොමැත. | |
| 2010 | 300 | *පාඨමාලාවේ දේශන අවසන් වී නොතිබුණි. | |

### 2.2.2 අරමුදල් ඌන උපයෝජනය.

බාහිර පර්යේෂණ ව්‍යාපාති 21 කට අදාලව ලැබූ ප්‍රදාන වලින් භාවිතයට නොගෙන ඉතිරි වී තිබෙන 2004 සිට 2008 දක්වා කාලයට අදාල රු. 1,226,191 ක මුදල් , පර්යේෂණ ප්‍රදාන ගිණුමේ පර්ශේෂව තිබුණි.

### 2.2.3 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම.

2010 සිට 2015 වර්ෂ වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස් කර තිබුණද, එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන පරිදි වාර්ෂික අයවැය ලේඛන පිළියෙල නොවීම නිසා එම සැලසුම් ලේඛන වලට පමණක් සීමා වී තිබුණි.

2.2.4 ආර්ථික නොවූ ගනුදෙනු.

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදාන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2(අ) පරිදි පුවත්පත් දැන්වීමක් මඟින් තරඟකාරී මිල ගණන් යටතේ ආයතනයට වඩාත් වාසිදායක අන්දමින් වත්කම් මිල දී ගතයුතු වුවත්, වටිනාකම රු.6,482,745 ක් වූ පරිගණක 73 ක් මිල දී ගැනීමේ දී ඊට පරිබාහිරව කටයුතු කර තිබුණි.

(ආ) ආයතනයේ පරිගණක මධ්‍යස්ථානය සඳහා සෘජු දුරකථන 04 ක් වර්ෂ ගණනාවක සිට භාවිතයට ගෙන නොතිබුනද, ඒ සඳහා රු.58,707 ක මුදලක් වැය කර තිබුණි.

2.2.5 කාර්ය මණ්ඩලය.

-------------------

අංක පීඊඩී/12 දරන හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 ඡේදය පරිදි මානව සම්පත් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

2.2.6 අයවැය ලේඛනමය පාලනය.

-------------------------------

පහත සඳහන් පරිදි අයවැය ගත සහ තත්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලක කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(i) වැය විෂයයන් 05 කට අදාළව රු.13,670,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සළසා තිබුණ ද, ඊට අදාළව කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ මුදලම ඉතිරි කර තිබුණි.

(ii) වැය විෂයයන් 06 කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන 4% සිට 264% ක් දක්වා ප්‍රමාණයකින් ඉක්මවා රු.8,225,000 ක වියදමක් දරා තිබුණ ද, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(iii) වැය විෂයයන් 07 කට අදාළව රු.7,847,000 ක ඉතිරියක් සිදු වී තිබූ අතර, එහි ප්‍රතිශතය 15% සිට 64% ක් දක්වා විය.

3. පද්ධති හා පාලන.

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා අධ්‍යක්ෂවරයා වෙත වරින්වර මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම් තැබීම
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) වැඩමුළු හා කෙටි කාලීන පාඨමාලා පැවැත්වීම
(ඈ) අත්තිකාරම් ගෙවීම්.
(ඉ) ලේඛන පැවැත්වීම.
(ඊ) අභ්‍යන්තර පාලනය
(උ) පර්යේෂණ ප්‍රගතිය